# සිංහල බ්‍රේල් ක්‍රමය හා අක්ෂර වින්‍යාසයඃ සමාජ මනෝවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්. හඳපාන්ගොඩ - සිංහල අධ්‍යයනාංශය

සිංහල බ්‍රේල් ක්‍රමය මගින් සිංහල අක්ෂර වින්‍යාස සම්මුති නිරූපණය කිරීම සඳහා දරා ඇති ප්‍රයත්නවලදී *ස්පර්ශීය ආකූලතාව (tactual confusion)* දිරිගන්වනසුලු ඇතැම් ප්‍රවණතා නිර්මාණය වී ඇති බවත්, මෙබඳු ප්‍රවණතා දෘශ්‍ය සීමිතතා සහිත සිංහල භාෂා ඉගෙනුම්ලාභීන්ගේ අක්ෂර වින්‍යාස නිරවද්‍යතාව කෙරෙහි නිෂේධනාත්මක බලපෑමක් සිදු කිරීමට සමත් වන බවත් මෑත කාලීන පර්යේෂණ මගින් අනාවරණය වේ. දෘශ්‍ය සීමිතතා සහිත පුද්ගලයන් තුළ හානිපූරණමය වශයෙන් තියුණු වූ ස්පර්ශ සංවේදන පවතින බවට සාක්ෂි ලැබෙන පසුබිමක් තුළ උක්ත ප්‍රවණතා පිළිබඳ අනාවරණ සිදු වීමද සුවිශේෂ අවධානයට ලක් විය යුත්තකි (Cattaneo and Vecchi). එසේ ම සාහිත්‍යයික අනාවරණවලට අනුව බ්‍රේල් සංකේත මගින් සිංහල අක්ෂර වින්‍යාස සම්මුති නිරූපණය කිරීම විෂයයෙහි දරා ඇති ප්‍රයත්නවලදී ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කර ඇත්තේ දෘශ්‍ය සීමිතතා රහිත පුද්ගලයන්ය. මෙම පසුබිම තුළ සිදුවූ මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය වූයේ සිංහල අක්ෂර වින්‍යාස සම්මුති බ්‍රේල් සංකේත භාවිතයෙන් නිරූපණය කිරීමට දරා ඇති ප්‍රයත්න මගින් දෘශ්‍ය සීමිතතා සහිත සිංහල භාෂා ඉගෙනුම්ලාභීන්ගේ අක්ෂර වින්‍යාස නිරවද්‍යතාව කෙරෙහි සිදුවී ඇති බලපෑම ගවේෂණය කිරීමය. *සංවේදන හානිපූරණය (sensory compensation), අධිපති සංවේදනය (dominant sense), නොහැකියාව පිළිබඳ සමාජයීය මොඩලය (social model of disability) හා මිනිස් දැනුම සහ බලය පිළිබඳ මිෂෙල් ෆුකෝගේ (Michel Foucault) න්‍යායාත්මක අනාවරණ* යන න්‍යායික කරුණු මත පදනම්ව නිර්මිත සමාජ-මනෝවාග්විද්‍යාත්මක න්‍යායාත්මක ප්‍රවේශයක් ඔස්සේ මෙහෙයවුණු මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ සැලැස්මක් හා අක්ෂර වින්‍යාස පරීක්ෂණය හා සම්මුඛ සාකච්ඡා යන දත්ත රැස් කිරීමේ විධික්‍රම භාවිත කෙරිණ. මෙම පර්යේෂණය සඳහා පහසු නියැදි ක්‍රමය උපයුක්ත කර ගැනුණු අතර පිළිවෙළින් දෘශ්‍ය සීමිතතා සහිත හා රහිත සිංහල භාෂාව හදාරන කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථීන් 19 දෙනෙකු බැගින් වන පරීක්ෂණ කණ්ඩායමකින් හා සැසඳුම් කණ්ඩායමකින් නියැදිය සමන්විත විය. සිංහල බ්‍රේල් ක්‍රමයේ නිර්මාණ පසුබිම තුළ පවතින *දෘශ්‍ය ආධිපත්‍යය (visual dominance)* බ්‍රේල් සංකේත මගින් නිරූපිත සිංහල අක්ෂර වින්‍යාස සම්මුති ප්‍රායෝගික ව භාවිත වන අක්ෂර වින්‍යාස පරිස්ථිතියක් තුළ දෘශ්‍ය සීමිතතා සහිත සිංහල භාෂා ඉගෙනුම්ලාභීන් *'නොහැකි' (disabled)* පුද්ගලයන් බවට පත් කිරීම සඳහා තීරණාත්මක දායකත්වයක් ලබා  දෙන බව අධ්‍යයන ප්‍රතිඵල මගින් අනාවරිත ය.

**ප්‍රමුඛ පදඃ** *සිංහල බ්‍රේල් ක්‍රමය, අක්ෂර වින්‍යාස නිරවද්‍යතාව, සමාජ-මනෝවාග්විද්‍යාව, දෘශ්‍ය ආධිපත්‍යය, ස්පර්ශීය ආකූලතාව*